# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
ஆரம்ப கைத்தொழில் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
MINISTRY OF PRIMARY INDUSTRIES AND SOCIAL EMPOWERMENT


| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No DSD/HO/14/SS/2/7/7/2019 | ඔබේ අංකය<br>உமது இல<br>Your No ........................ | දිනය<br>திகதி<br>Date 2019.06.28 |

**සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,**

**සියලුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන් වෙත.**

**<u>සමෘද්ධි සමාජ ආරක්ෂණ අරමුදල යටතේ "සමෘද්ධි සිප්දොර" ශිෂ්‍යත්ව වැඩසටහන ක්‍රියාත්මක කිරීම -2019 /2021 අධ්‍යයන වර්ෂය</u>**

උකත් ශිර්ෂය යටතේ මේ වන විට නිකුත් කර ඇති 2019.05.02 දිනැති සමෘද්ධි දෙපාර්තමේන්තු චක්‍රලේඛ (සමාජ ආරක්ෂණ) අංක 04/2019 මගින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කල යුතු ආකාරය පිළිබඳව උපදෙස් ලබා දී ඇත.

02. එසේ වුවද මෙම වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට නියමිත මෙම සිප්දොර ශිෂ්‍යත්ව වැඩසටහන පහත සඳහන් පරිදි අදියර 03 ක් අනුව සිදු කිරීමට නියමිතය.

I. 2019/2021 අධ්‍යයන වර්ෂයේ මෙන් 2017/2019 හා 2018/2020 අධ්‍යයන වර්ෂ සඳහා ද සම්මුඛ පරීක්ෂණයට සහභාගි වූ සියළුම සිසුන් සහ යම් හේතුවකින් ඉල්ලීම් කිරීමට නොහැකි වූ සියළුම සහනාධාරලාභී පවුල්වල අ.පො.ස (උ.පෙ.) හදාරන සිසුන් සඳහා ඔවුන්ගේ අධ්‍යයන වර්ෂවල ඉදිරි කාලය සඳහා සිප්දොර ශිෂ්‍යත්ව ලබා දීම . එම නාම ලේඛණ දිස්ත්‍රික් අධ්‍යක්ෂ විසින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් නිවැරදිව සකස්කර 2019.07.20 දිනට පෙර දිස්ත්‍රික් ලේකම්ගේ අනුමැතිය සහිතව ප්‍රධාන කාර්යාලයේ සමාජ ආරක්ෂණ හා සුභසාධන අංශයට තැපැල් මඟින් එවිය යුතු අතර,


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අධ්‍යක්ෂ (පාලන හා ආයතන)<br>பணிப்பாளர் ( நிர்வாகம்/தாபனம்)<br>Director (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |

යුනිකෝඩ් භාවිතයෙන් (සිංහල මාධ්‍ය - Unicode–Iskolapotha –Ms office Excel) (දමිල මාධ්‍ය - Unicode – Kalaham - Ms office Excel) පහත ලිපිනයට ඊ මේල් මාර්ගයෙන් ද ලැබීමට සැලැස්විය යුතුය. ssfsamurdhi@yahoo.com (ඇමුණුම් 03 ආකෘති පත්‍රය අනුව) තවද ඇමුණුම් අංක 04 පරිදි වාර්තාවක් ඉහත ඊමේල් ලිපිනයට හා තැපැල් මගින් එවිය යුතුය.

මෙහිදී 2017/2019 අධ්‍යයන වර්ෂය සඳහා 2019 ජූලි සිට අගෝස්තු දක්වා මාස 02 ක කාලය සඳහා ද ගෙවීම් කිරීම සහ 2018/2020 අධ්‍යයන වර්ෂයට අදාලව 2019 ජූලි සිට 2020 අගෝස්තු දක්වා කාලය සඳහා ද ගෙවීම් කිරීමට නියමිතය.

II. 2019/2021 අධ්‍යයන වර්ෂය සඳහා මේ වන විට සමෘද්ධි සහනාධාරලාභී පවුල්වල අ.පො.ස (උ.පෙ.) හදාරන බවට තහවුරු කර ගන්නා සියළුම දරුවන් සඳහා. (2019.05.02 දිනැති සමෘද්ධි දෙපාර්තමේන්තු චක්‍රලේඛ (සමාජ ආරක්ෂණ) අංක 04/2019 අනුව නියමිත දිනට එනම් 2019.07.20 දිනට ප්‍රධාන කාර්යාලය වෙත නාම ලේඛන ඉදිරිපත් කිරීම.)

III. නව සමෘද්ධි සහනාධාර ලබාදීමේ වැඩසටහන යටතේ පළමු වටය සඳහා මේවන විට සමෘද්ධි සහනාධාර හිමිකම් ලැබූ පවුල් වල අ.පො.ස (උ.පෙ) හදාරනු ලබන දූවා දරුවන් සඳහාද සිප්දොර ශිෂ්‍යත්ව ලබා දීම.

මීට ඉහත නිකුත් කර ඇති DDD/HO/14/1 හා 2017.01.24 දිනැති ලිපියේ අංක 5 ඡේදයේ සඳහන් "සමාජ ආරක්ෂණ අරමුදලේ සාමාජිකත්වය හිමිවන්නේ සහනාධාර ලැබී මාස 03 ඉක්ම වූ පසුව යන්න" ලෙස ලබා දෙන ලද උපදෙස් මින් අවලංගු වන අතර, සමාජ ආරක්ෂණ අරමුදලේ සාමාජිකත්වය නව සමෘද්ධි සහනාධාර හිමිකම් ලැබූ දා සිට හිමිවනු ඇත. එම ඡේදයේ අනෙකුත් වගන්ති එලෙසම ක්‍රියාත්මක වේ.

තවද දෙවන වටයේ ආභියාචනා මත සමෘද්ධි සහනාධාර සඳහා තෝරාගනු ලබන පවුල් වල අ.පො.ස (උ.පෙ) හදාරනු ලබන දූවා දරුවන්ගේ නාම ලේඛණ ද සමෘද්ධි සිප්දොර ශිෂ්‍යත්ව ලබා දීම සඳහා ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කල යුතුය.

03. දිස්ත්‍රික් ලේකම් කාර්යාල මට්ටමින් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් මෙකී සිප්දොර ශිෂ්‍යත්ව ප්‍රදානයන් හා දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට අදාල උපදෙස් ඉදිරියේ දී ලබා දීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි

සිප්දොර ශිෂ්‍යත්ව වැඩසටහනේ සාර්ථකත්වය උදෙසා ඔබ ඇතුළු කාර්යය මණ්ඩලය දක්වන සහය ඉතා අගය කොට සලකමි.

එස්.ඊ.ආර්.ටී.එම්.එස්.පී. බණ්ඩාර

අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:-

1.ලේකම් - ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය - කාරුණික දැ.ගැ.පි.

3.සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් -ඉහත උපදෙස් අනුගමනය කරමින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සිප්දොර ශිෂ්‍යත්ව වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කිරීම සඳහා

4.ප්‍රධාන ගණකාධිකාරි - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කාරුණික දැ.ගැ.පි. සහ අ.ක.ස.

5.සියලුම අංශ ප්‍රධානින් - කාරුණික දැ.ගැ.පි. සහ අ.ක.ස.